# පිළිසඳර

2016
ජූලි/අගෝස්තු
pilisandara.npas@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Society of Sri Lanka


## මතකනේ ! මහා සභාව ජූලි 17

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 63 වන වාර්ෂික මහා සභාව සඳහා සියලු කටයුතු සූදානම් කර තිබේ. ජූලි 17 වැනි ඉරු දින මහවැලි කේන්ද්‍රයට පැමිණ ඒ සඳහා ඔබගේ සක්‍රීය දායකත්වය ලබාදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු. ව්‍යවස්ථාව අනුව නිල ආරාධනා පත්‍රය හා න්‍යාය පත්‍රය පසුගිය පිළිසඳරෙන් ඔබට එවා ඇති බැවින් මේ දෙවන මතක් කිරීම අතිශය ලෙන්ගතු සුහද ඇරයුමකි. ගෙවීගිය වර්ෂයේ නිල අයවැය ලේඛනය සඳහා 04, 05 පිටු බලන්න.

## ඡායාරූප ශිල්පී ආචාරධර්ම දොරට වැඩීම



ආචාරධර්ම සංග්‍රහයේ පළමු පිටපත සංගමයේ සභාපතිවරයා විසින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිළිගැන්වූ අවස්ථාව

ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පීන් සඳහා වන ආචාරධර්ම පද්ධතියක් සම්පාදනය කොට දොරට වැඩීම ජූලි මස 02 වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී සිදුකෙරිණි. සංගමයේ විශේෂිත ආචාරධර්ම සම්පාදන කමිටුවක හා විද්වත් අධීක්ෂණ කමිටුවක දායකත්වයෙන් මෙම කාර්යය මහත් සාර්ථක ලෙස ඉටුකරනු ලැබ ඇත.

ආචාරධර්ම සංග්‍රහය ජනගත කිරීමේ උත්කර්ෂවත් අවස්ථාවට පාසල් සිසුන්, වෘත්තීය ඡායාරූප ශිල්පීන්, මෙරට සුප්‍රසිද්ධ ඡායාරූප කලාවේදීන්, ඡායාරූප ශිල්ප ව්‍යාපාරික ආයතන සහ මාධ්‍යවේදීන් රැසක් පැමිණ සිටියහ. අදාළ ක්ෂේත්‍ර 04 හි වගකිවයුතු රාජ්‍ය නිලධාරීහු එදින නිල වශයෙන් මෙම සංග්‍රහය පිළිගත්හ. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රංග කලන්සූරිය, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ අනුෂා ගෝකුල ප්‍රනාන්දු, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ජාතික නිපුණතා අධ්‍යක්ෂ වජිර පෙරේරා සහ කර්මාන්ත සබඳතා අධ්‍යක්ෂ සුනිල් කපුගේ, විෂය සමගාමී මාර්ගෝපදේශන ඒකකයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සරෝජිනී වික්‍රමසිංහ යන මහත්ම මහත්මීහු මේ සඳහා සහභාගි වූහ.

2015 පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණයේ සහතික ප්‍රදානය ද, සමාජසේවා සහ සුබසාධන අංශයේ ව්‍යාපෘති ඡායාරූප ප්‍රදර්ශනය ද මෙම උත්සවය සමග පවත්වන්නට යෙදිණි.


QD/95/NEWS/2016

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# හඳුනාගත්තොත් ඔබ මා...

## ජී. හෙට්ටිආරච්චි - කැමරාව සමග එකට කැට්වූ නිහතමානීත්වය



හෙට්ටිආරච්චිගේ සයිමන් සහ පොත්තෙවෙල කංකානම් ගමගේ ගිමාරා මව්පිය දෙපළට දාව 1938 දී උපත ලද හෙට්ටිආරච්චිගේ ගුණදාස පසු කලෙක ලාංකේය ඡායාරූප කලා ක්ෂේත්‍රයේ දිදුලන නමක් වනු ඇතැයි කිසිවෙකුත් නොසිතන්නට ඇත. කැකනදුර ප්‍රදේශයේ සහෝදර සහෝදරියන් හයදෙනෙකුගෙන් යුතු පවුලක පස්වෙනියා වූ අප කතා නායකයා, ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පා එසවූයේ මොටාගෙදර රජයේ විද්‍යාලයට ය. ටික කලකට පසු පවුලේ අය සමග අග නගරයට සම්ප්‍රාප්තවීම හේතුවෙන් ඔහුට සිය පාසල් අධ්‍යාපනය සඳහා කළුබෝවිල බුද්ධඝෝෂ විදුහලට ඇතුළත් වන්නට සිදුවිය. ඉන් අනතුරුව වැල්ලවත්ත අර්තුසා විදුහලෙන් හෙතෙම පාසල් අධ්‍යාපනය හමාර කළේ ය.

ඡායාරූප ශිල්පය සඳහා ඔහු තුළ යම් ඇල්මක් පහළ වූයේ එවක බුද්ධඝෝෂ විද්‍යාලයේ තෝමස් ගුරුතුමා සතුව තිබූ පෙට්ටි කැමරාවේ මහිමය ඇස් පනාපිට ම දැකගන්නට ලැබීම හේතුවෙනි. කොහොමටත් චිත්‍ර කලාවට ඇලුම් කළ ගුණදාසයන් රූපයට අපූරු ගුණයක්, අරුතක් ගෙන දෙන කැමරා රූප නිර්මාණය සිය අනාගත ගමන් මග ලෙස තෝරාගන්නට තරම් එඩිතර විය. පාසල් ගමනට ගෙදරින් ලැබෙන වියදම ඉතිරි කොටගෙන රු. 45 කට 127 ප්‍රමාණයේ කැමරාවක් මිලයට ගන්නට ඔහු සකසුරුවම් වූයේ ය.

බොහෝ අරපරිස්සමට රූපගත කරන පටල පටය රැගෙන පැසුරුම් කිරීම සඳහා ඔහු පා නැගුයේ වැල්ලවත්ත ඇක්මී ෆොටෝ ආයතනය වෙත ය. එහි අධිපති ඒ.ඩී. ලෙනට් සිල්වා මහතා මේ කොලුගැටයාගේ දැඩි උනන්දුව නිසාම තමා දන උගත් බොහෝ දේ ඔහුට කියාදුන්නේ ය. ඡායාරූප ශිල්පය හැදෑරීමේ දැඩි වුවමනාව නිසා එවක ශත 35 සිට 60 අතර මුදලකට කාගිල්ස්, මිලර්ස් සමාගම්වල අලෙවි කෙරුණු ඡායාරූප ශිල්ප ප්‍රකාශන මිල දී ගෙනැවිත් කියවන පුරුද්දක් ගුණදාස තරුණයා සතු විය. එමගින් ඔහු මහත් දැනුම් සම්භාරයක් උකහාගත්තේ ය. මේ බව මැනවින් නිරීක්ෂණය කළ ලෙනට් සිල්වා මහතා ඇක්මී ෆොටෝ ආයතනයට සම්බන්ධ වන මෙන් ඔහුට ඇරයුම් කළේ ය. ගෙදර අයගේ අකමැත්ත මධ්‍යයේ වුව වසර 3ක කාලයක් ඇක්මී ආයතනයේ චිත්‍රාගාර හා එළිමහන් ඡායාරූප ශිල්පියෙකු ලෙස ඔහු කටයුතු කළේ ය.

මේ කාලය තුළ ෆ්‍රෙඩ් මල්වැන්න මහතා ද ඇසුරු කරන්නට අවකාශ ලැබුණු අතර ඔහුගේ දැනුම්දීම මත ඩොනල්ඩ් චිත්‍රාගාරයේ රැකියාවකට හෙට්ටිආරච්චි තරුණයා සුදුසුකම් ලැබීය. ඩොනල්ඩ් ආයතනයේ රැකියාව සේ ම මේ අවධියේ රු. 645/= කට මිලයට ගත් Rolleicord කැමරාව ඔහුගේ නිර්මාණශිලී ඉදිරිගමනට විශාල පිටිවහලක් විය. ඒ සමග ම ඡායාරූප ශිල්පය වැඩිදුර ඉගෙනීම පිණිස රජයේ ලලිත කලායතනයේ ඡායාරූප ශිල්ප පාඨමාලාවට හෙට්ටිආරච්චි තරුණයා සම්බන්ධ විය. බී.පී. වීරවර්ධන මහතා යටතේ ලත් එම අධ්‍යයනය ජී.හෙට්ටිආරච්චි නමින් වන පරිණත නිර්මාණකරුවාගේ නිර්මාණ දිවියට මහා දිරියක් විය. ටික කලක දී ෆ්‍රෙඩ් මල්වැන්න මහතාගේ ඇරයුමින් ෆොටෝටෙක්නිකා ආයතනයේ කැමරා අලුත්වැඩියා අංශය භාරගන්නට හෙට්ටිආරච්චි මහතාට සිදු විය. මේ යුගයේ ඡායාරූප ශිල්පය පිළිබඳ අත්දැකීම් බොහෝ දුරට පුළුල් කරගන්නට ඔහුට අවකාශ ලැබිණි. ප්‍රතිවර්තා පටල මගින් මංගල උත්සව රූගතකරණය, මංගල උත්සව 8mm පටල මගින් චිත්‍රපටකරණය, 16mm සහ 28mm පටල පැසුරුම්කරණය වැනි විරල ගණයේ අත්හදාබැලීම් ඒ අතර වෙයි.

1964 දී කැමරා ළමා සමාජයට එක්වූ හෙට්ටිආරච්චි ශිල්පියා එවක පටන් අද දක්වා ම ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ උන්නතිය සඳහා විවිධාකාරයෙන් දායක විය. ප්‍රදර්ශන ලේකම්වරයෙකු මෙන් ම සංගමය ව්‍යවස්ථාපිත කරලීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු, ඡායාරූප පාඨමාලා උපදේශකවරයෙකු, විභාග පරීක්ෂකවරයෙකු වශයෙන් ඔහුගේ දායකත්වයන් පසස්නා මනා ය. ඊට අමතරව තමා සතු දැනුම කඳුරට ඡායාරූප සංගමය, ශ්‍රී ලංකා ඡායාරූප සංගමය, පොලිස් දෙපාර්තමේන්තුව යන ආයතනවලට ද නිර්ලෝභීව බෙදා දෙන්නට හෙට්ටිආරච්චි මහතා ඉදිරිපත් විය.

නිර්මාණකරුවෙකු ලෙසින් ඔහු සංගමයේ ANPAS, Hon. FNPAS සම්මානවලින් ද, ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ AFIAP සම්මානයෙන් ද පිදුම් ලැබීය. එංගලන්තයේ රාජකීය ඡායාරූප සංගමයේ සාමාජිකත්වය ද ලබා ඇති ඒ මහතා පාකිස්ථානයේ ගෞරව සහාගී සම්මානය (Hon. FPSG) ද ලැබීය. 80 දශකයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ඡායාරූප අනුමණ්ඩලයේ දෙවන සභාපතිවරයා ද විය. සාර්ක් ලේකම් කාර්යාලය පළමු වරට සංවිධානය කළ සාර්ක් ආසියාතික ඡායාරූප ප්‍රදර්ශනයේ සංවිධායකවරයා වූයේ ද ඔහු ය. තේ ශත සංවත්සරයේ දී ඔහු ඊට සම්පාදනය කළ ඡායාරූප එකතුව මෙරට විශේෂිත ජාතික උරුම වාර්තාවක් වෙයි.

කීර්තිමත් ඡායාරූප ශිල්පියෙකු ලෙස ඔහු ලෝක ප්‍රසිද්ධියට පත්වූයේ ජර්මනිය, හොංකොං, ජපානය, ඉන්දියාව, බ්‍රසීලය, බංග්ලාදේශය යන රටවල සිය නිර්මාණ ප්‍රදර්ශනය කරමිනි. 1968 දී කොළඹ කොටුවේ ආරම්භ කළ FOTOFOCUS චිත්‍රාගාරය හෙට්ටිආරච්චි මහතාට ජාතික වශයෙන් ප්‍රසිද්ධියක් සහ කීර්තියක් ගෙනදීමට හේතු විය. විල්සන් හැගොඩ මහතා සමග ගතකළ එක් සැන්දෑවක මීවිතෙන් උණුසුම් වෙමින් චිත්‍රාගාරයට නම යෙදූ හැටි හෙට්ටිආරච්චි මහතා සිහිකරන්නේ මහත් ආස්වාදයකිනි.

සෙනෙහෙබර බිරිඳගේ සහ දයාබර දියණියකගෙන් සමන්විත කුඩා පවුල් ඒකකයක් තුළ සැනසුමින් දිවි ගෙවන ජී. හෙට්ටිආරච්චි නම් වන මේ නිහතමානි ඡායාරූප කලාවේදියා නිර්මාණකරණයෙන් ද, චරිතාදර්ශයෙන් ද ඔබටත් මටත් වටහාගත යුතු, ප්‍රගුණ කළ යුතු බොහෝ දෑ අප හමුවේ ඉතිරි කර තිබේ. අපි ජී. හෙට්ටිආරච්චි මහතාණන්ට නිදුක් නිරෝගි සුව, චිර ජීවනය පතමු !

**උදිත ගයාෂාන්**

# නැවතත් කියා සිටින වග නම්.....

# මේ ඔබේ ආරාධනා පත්‍රයයි

හිතවත් සාමාජික ඔබ වෙත පිළිගැන්වෙන ළෙන්ගතු ආරාධනය !

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 63 වන වාර්ෂික මහා සභා රැස්වීම**

**දිනය : 2016 ජූලි 17 ඉරු දින**

**ස්ථානය : කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරය**

**වේලාව : පෙ.ව. 9.00**

මූලස්ථානය ගොඩනැගීම සහ සංගමයේ හෙට දවස ගැන තීරණාත්මක කතිකාව සඳහා සංගමය වෙනුවෙන් එදින ඔබේ පැමිණීම ඉතාමත් ම වැදගත් ! සංගමය මගින් සම්පාදිත ඡායාරූප ශිල්පී ආචාරධර්ම සංග්‍රහය එදින ඔබ වෙත පිළිගැන්වීමට ද නියමිතයි.

**මේ සෙනෙහෙබර ඇරයුම ඒ යුතුකම උදෙසා යි ..**

**- අධ්‍යක්ෂ මණ්ඩලයේ අපි -**

මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය පසුගිය පිළිසඳර සමග ඔබ වෙත එවා ඇත. ඒ සඳහා ඉදිරිපත් කිරීමට ඇති ඔබගේ යෝජනා 2016 ජූලි මස 10 වන දිනට පෙර විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, 170, කොලොන්නාව පාර, දෙමටගොඩ යන ලිපිනයට ලැබෙන්නට සලස්වන්න. ඔබගේ පැමිණීම 2016 ජූලි මස 10 වන දිනට පෙර 077 7519679 / 071 4424895 / 071 8106680 අංකයක් අමතා තහවුරු කිරීම සංවිධාන කාර්යයට පහසුවකි.

## ගොඩනැගිලි අරමුදලට ඔබේ දායකත්වය



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම ක්‍රම තුනට යටත්ව රු. 12000/=ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු. මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.

<u>ගෙවීම් ක්‍රම විධි</u>

1. එකවර රු. 12000/= ක මුදල පරිත්‍යාග කිරීම.
2. 2016 දෙසැම්බර් 31 දිනට පෙර රු.6000/= ක මුදලක් සහ 2017 දෙසැ 31ට පෙර ඉතිරි රු. 6000/= ක මුදල පරිත්‍යාග කිරීම.
3. මසකට රු. 1000/= බැගින් මාස 12ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම.

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු. 12000/= මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශිර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. මුදල් පරිත්‍යාග කරනු ලබන අනුපිළිවෙළ අනුව මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාලාභීන්ගේ නාමලේඛනය මීළඟ පිළිසඳර කලාපයේ පටන් පළ කෙරේ.

සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශීර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සමාජිකයෙකු නුවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

O. T. David & Co.
Chartered Accountants

**THE NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA.**
**P.O. BOX 452, Colombo.**
**STATEMENT OF FINANCIAL POSITION AS AT 31ST MARCH, 2016.**
**(All Amounts in Sri Lankan Rupees)**

| | NOTES | | 31.03.2016 |
|---|---|---|---|
| **ASSETS :-** | | | |
| **Non Current Assets** | | | |
| Lease hold land | | 261,333.00 | |
| Multi Media Projector | | 52,500.00 | 313,833.00 |
| **Current Assets** | | | |
| Stock of Books | | - | |
| Receivables | | 42,950.00 | 42,950.00 |
| **Cash Account** | | | |
| B.O.C - Bambalapitiya A/C No: 717752 | | 839,518.78 | |
| Commecial Bank of Ceylon PLC | | 29,463.23 | |
| B.O.C Borella (Lanka Camera) | | 32,648.30 | |
| Sampath Bank C/A | | 139,988.70 | |
| NSB Kirulapana S - A/C No:134243 | | 267,988.22 | |
| N.S.B - B. Fund SA 1 0001 01 00838 | | 466,026.90 | |
| Fixed Deposit at B.O.C Bambalapitiya | | 686,569.62 | |
| Fixed Deposit at B.O.C Borella (Lanka Camera) | | 418,987.14 | 2,881,190.89 |
| | | | **3,237,973.89** |
| **LIABILITIES :-** | | | |
| Accumulated Fund | | 2,140,651.95 | |
| Donations for Building Fund | | 651,250.00 | |
| *Add:-* Surplus / (Deficit) | | 287,261.82 | 3,079,163.77 |
| Loan A/C | | - | |
| Accruals & payable | A | 158,810.12 | 158,810.12 |
| | | | **3,237,973.89** |

*We have Audited the foregoing Statement of Financial Position as at 31st March, 2016 and the relevant accounts for the year ended on that date .*

*In our opinion,so far as appears from our examination, the said Statement of Financial Position and the related Income and Expenditure Accounts which are in agreement with the books give a true and fair view of the state of affairs of the society as at 31st March,2016 and its Surplus/(Deficit) for the year then ended.*

**CHARTERED ACCOUNTANTS**
**COLOMBO**
*30th June 2016.*
**RTJ/ NA** **Financial Statements 2015/16** **1**

O. T. DAVID & CO. No. 15/2, 27th Lane, Colombo - 03. CHARTERED ACCOUNTANTS

15/2, 27th Lane, (Off 5th Lane), Colombo - 03, Sri Lanka. Tel. : 011-2564409 Fax : 011-2564410

# O. T. David & Co.
Chartered Accountants

**THE NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA.**
**P.O. BOX 452, Colombo.**
**STATEMENT OF INCOME FOR THE YEAR ENDED 31ST MARCH , 2016.**

*(All Amounts in Sri Lankan Rupees)*

| | | 2015/16 |
|---|---|---|
| **INCOME** | | |
| Membership Fees | 437,300.00 | |
| New Membership Entrance Fees | 119,000.00 | |
| Professional Membership Fees | 134,100.00 | |
| Contribution for Promotional Pack | 422,600.00 | |
| Examination Fees | 148,100.00 | |
| Exhibition Receipts | 505,038.70 | |
| Receipts From Workshops | 19,700.00 | |
| Donations & other receipts | 950.00 | 1,786,788.70 |
| **INTEREST INCOME** | | |
| Interest on NSB SA No 134243 | 15,168.60 | |
| Interest on NSB SA No 1-000-01-00838 | 15,158.98 | |
| Interest on FD at BOC Bambalapitiya | 77,928.70 | |
| Interest on FD at BOC Borella | 25,171.28 | 133,427.56 |
| | | 1,920,216.26 |
| **EXPENDITURE** | | |
| Administration Expenses + FIAP fees | 391,677.32 | |
| Educational and Examination Expenses | 149,218.50 | |
| Expenses on Out-door Workshops | 32,464.00 | |
| Expenses on Promotional Pack | 240,250.00 | |
| Expenses on Promotional Pack (Books Stock) | 136,950.00 | |
| Exhibition Expenses | 568,938.22 | |
| Pilisandara Publication Expenses | 66,374.00 | |
| Audit Fees | 15,500.00 | |
| Bank Charges | 5,415.40 | |
| Amortisation / Depreciation | 26,167.00 | 1,632,954.44 |
| ***Surplus / (Deficit)*** | | ***287,261.82*** |

O. T. DAVID & CO. No. 15/2, 27th Lane, Colombo - 03. CHARTERED ACCOUNTANTS

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## සංගමයේ සාමාජිකත්වය පිරිනැමීම සඳහා අදාළ නිර්ණායක

**සාමාජිකත්වය අයදුම් කිරීම**

සෑම ලිත් වර්ෂයක ම නිශ්චිත කාල වකවානුවක ප්‍රසිද්ධ දැන්වීම් මගින් සාමාජිකත්වය ලබාගැනීමට අවකාශ සැලැස්වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් නිකුත් කරන සාමාජික අයදුම්පතක් පුරවා අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ඕනෑ ම ශ්‍රී ලාංකේය හෝ විදේශීය පුරවැසියෙකුට සාමාජිකත්වය අයදුම් කළ හැකි ය.

**සාමාජිකත්වය ලැබීම**

සාමාජික අයදුම්පත්‍රයේ ඇතුළත් සඳහනට අනුව ජ්‍යෙෂ්ඨ සාමාජික භවතෙකුගේ නිර්දේශ සලකා බලා, සම්මුඛ පරීක්ෂණයකින් පසු සාමාජිකත්වය ප්‍රදානය කෙරේ. කවර හෝ සාධාරණ හේතුවක් පවතී නම්, අයදුම්කරුට හේතු දැක්වීමකින් තොරව සාමාජිකත්ව අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය සංගමය සතු වේ.

**සාමාජිකත්වය**

ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට යටත් වන පරිදි සාමාජිකත්ව ප්‍රභේදවලට අනුව සාමාජිකත්වය ප්‍රදානය කෙරේ. සාමාජිකත්ව පිරිනැමීම සම්බන්ධ වගකීම විධායක අධ්‍යක්ෂවරයාට පැවරේ.

**1. සාමාජිකත්වය - Membership**

විධායක අධ්‍යක්ෂවරයා සහ/හෝ ලේඛකාධිකාරීවරයාගේ වගකීම යටතේ පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ කමිටුවක නිර්දේශ පරිදි ප්‍රදානය කරනු ලබයි.

**2. පාසැල් සාමාජිකත්වය - Student Membership**

පාසැල් සිසුන් විදුහල්පතිතුමන්ගේ අනුමැතියට යටත් ව කරනු ලබන ඉල්ලීම් සලකා බලා ප්‍රදානය කරනු ලබන්නකි.

**3. යාවජීව සාමාජිකත්වය - Life Membership**

අඛණ්ඩව වසර 05 ක සාමාජිකත්වයක් සම්පූර්ණ කිරීමෙන් පසු, අදාළ සාමාජිකයා විසින් විධායක අධ්‍යක්ෂවරයා වෙතින් කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික තීන්දුවකට යටත් ව පිරිනමනු ලබන්නකි.

**4. ගරු සාමාජිකත්වය - Honorary Membership**

සංගමය වෙනුවෙන් කරන ලද සේවාව සැලකිල්ලට ගෙන ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් සහ ඒකමතිකත්වයෙන් ප්‍රදානය කරනු ලබන්නකි.

**5. ගරු සහාගී සාමාජිකත්වය – Hon. FNPAS**

සංගමයේ, ඡායාරූප ශිල්පයේ හෝ දේශීය හෝ විදේශීය කලා ක්ෂේත්‍රය සඳහා කරනු ලැබ ඇති සේවාව සැලකිල්ලට ගෙන ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් සහ ඒකමතිකත්වයෙන් ප්‍රදානය කරනු ලබන්නකි.

**6. අධ්‍යයන කාර්ය හා කුසලතා ඇගයීම් මත පිරිනැමෙන සාමාජිකත්ව.**

මේවා ලේඛකාධිකාරීවරයා විසින් පත්කරනු ලබන ඇගයීම් මණ්ඩලයක නිර්දේශය පරිදි වාර්ෂික ව පිරිනැමේ. මෙකී සම්මාන පිළිබඳ වගකීම, පරිපාලන වශයෙන් විධායක අධ්‍යක්ෂවරයාට, ලේඛකාධිකාරීවරයාට මෙන් ම අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ද පැවරේ.

**6.1 වරලත් සාමාජිකත්වය - LNPAS**

පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරලීමෙන් සහ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පදනම් කොටගෙන පිරිනමනු ලැබේ.

(අ) වසර 05 කට නොඅඩු කාලයක් ඡායාරූප ශිල්පියෙකු හෝ ඊට ආබද්ධ ක්ෂේත්‍රයක පූර්ණකාලීන වෘත්තිකයෙකු වශයෙන් සේවය කොට තිබීම. සහ,

(ආ) සංගමයේ සාමාජික නොවන සහ ශ්‍රී ලාංකික නොවන ඡායාරූප ශිල්පීන්ට ද මෙම සම්මානය අයදුම් කළ හැකි නමුදු සම්මානය ඉල්ලුම් කරන අවස්ථාවේ ම සංගමයේ සාමාජිකත්වය ද ලබාගත යුතු ය.

සේවය තහවුරු කිරීමේ සාධක සමග සංගමය විසින් නියම කරනු ලබන පරිදි නිර්මාණ හා අනිකුත් දේ පරීක්ෂක මණ්ඩලය හමුවේ ඉදිරිපත් කළ යුතු ය. එම මණ්ඩලය සෑහීමකට පත්විය හැකි මට්ටමේ වාචික පරීක්ෂණයකට මුහුණ දිය යුතු ය.

**6.2. ඇසුරු සාමාජිකත්වය - ANPAS**

පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලීමෙන් සහ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පදනම් කොටගෙන පිරිනමනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයෙකු වීම සහ සංගමය මගින් පවත්වන ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වී වසරක් ගතවී තිබීම. හෝ,

(ආ) වරලත් සාමාජිකත්වය ලබා වසරක කාලයක් ගතවී තිබීම. හෝ,

(ඇ) සංගමය විසින් පිළිගනු ලබන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 10 ක අවම වශයෙන් තම නිර්මාණ 05 ක් ප්‍රදර්ශනය වී තිබීම, හෝ,

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඡායාරූප ශිල්පය ප්‍රායෝගික විෂයයක් ලෙස හදාරා පංති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී, සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.

සංගමය විසින් කාලානුරූපව නියම කරනු ලබන පරිදි නිර්මාණ සහ අනිකුත් දේ පරීක්ෂක මණ්ඩලය හමුවේ ඉදිරිපත් කළ යුතු ය. අදාළ පරීක්ෂක මණ්ඩලයට සෑහීමකට පත්විය හැකි මට්ටමේ වාචික පරීක්ෂණයකට මුහුණ දිය යුතු ය.

**6.3. සහාගී සාමාජිකත්වය - FNPAS**

පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලීමෙන් සහ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පදනම් කොටගෙන පිරිනමනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයෙකු වීම. සහ,

(ආ) ඇසුරු සාමාජිකත්වය (ANPAS) ලබාගෙන දෙවසරක් ගත වී තිබීම සහ එම කාලය තුළ ප්‍රමාණවත් තරම් මාධ්‍ය ක්‍රියාකාරකම්හි නිරත වී තිබීම. සහ,

(ඉ) සංගමය විසින් කාලානුරූපව නියම කරනු ලබන පරිදි ඒක පුද්ගල ප්‍රදර්ශනයක් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) සංගමයේ සාමාජික නොවන සහ ශ්‍රී ලාංකික නොවන ඡායාරූප ශිල්පීන් මෙම චක්‍රලේඛයේ ඇමුණුම II, 02 (ඇ) වගන්තියේ ප්‍රතිපාදන පරිදි සහාගී සාමාජිකත්‍වය (FNPAS) අයදුම් කළ යුතු ය.

සංගමය විසින් කාලානුරූපව නියම කරනු ලබන පරිදි නිර්මාණ සහ අනිකුත් දේ පරීක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඉහත 6.1, 6.2 සහ 6.3 හි සඳහන් සම්මාන භාවිත කිරීමේ අයිතිය පවතිනුයේ සංගමයේ සාමාජිකත්වය පවත්වාගෙන යන තාක් පමණි.

**ඇමුණුම II**

**වරලත්, ඇසුරු හා සහාගී සම්මාන අයදුම් කිරීමේ සුදුසුකම්**

සංගමයේ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට යටත්ව වරලත් සාමාජිකත්‍ව, ඇසුරු සාමාජිකත්‍ව සහ සහාගී සාමාජිකත්‍ව සම්මාන අයදුම් කිරීමේ මූලික සුදුසුකම් පහත දැක්වේ. මේ සඳහා අයදුම් කරන අය තමන් විසින් සකසන ලද ජීවදත්ත ගොනුවක් සහිතව ලිඛිත අයදුම්පත්‍රයක් අදාළ ලිත් වර්ෂයේ ජූනි මස 30 ට ප්‍රථම ගරු විධායක අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතු ය. තමන් විසින් මෙතෙක් ලබා ඇති ඡායාරූප ශිල්පයට අදාළ සියලු ම ශාස්ත්‍රීය සුදුසුකම්වල, තරග ජයග්‍රහණවල සහ අදාළ සමාජ කාර්යයන්හි සහතිකපත් හා ලිපි ලේඛනවල පිටපත් ද එකී අයදුම්පතට අමුණා තිබිය යුතු ය.

**01. වරලත් සාමාජිකත්වය – Licentiateship**

(අ) සංගමයේ සාමාජිකත්‍වය ලබා නොමැති නම්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද සාමාජික අයදුම්පත හා ඊට අදාළ අනිකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

(ආ) ඡායාරූප ශිල්පය හා සම්බන්ධ තමාගේ සියලු වෘත්තීය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සනාථ කොට දක්වන සාධක ඉදිරිපත් කිරීම.

(ඇ) සෙ.මී. 30 x 40 ප්‍රමාණයට වැඩි නොවන හා සෙ.මී. 20 x 25 ප්‍රමාණයට අඩු නොවන නිර්මාණාත්මක ඡායාරූප 20 ක් ඉදිරිපත් කිරීම.

(ඈ) ඉහත (ඇ) හි සඳහන් නිර්මාණ ජාතික මට්ටමේ ප්‍රදර්ශනයකට සුදුසු වන බවට පරීක්ෂක මණ්ඩලය සෑහීමකට පත්විය යුතු ය.

**02. ඇසුරු සාමාජිකත්වය - Associateship**

(අ) අයදුම්කරු සංගමයේ සාමාජිකයෙකු විය යුතු අතර, සංගමය මගින් පවත්වන ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වී වසරක් ගත වී තිබිය යුතු ය. නොඑසේ නම් වරලත් සාමාජිකත්‍වය ලබා වසරක්ගතවී තිබිය යුතු ය.

(ආ) සෙ.මී. 30x40 ප්‍රමාණයට වැඩි නොවන හා සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන කලුසුදු ඡායාරූප 10 ක් ඉදිරිපත් කළ යුතු ය. මෙයට ආලේඛ්‍ය, භූමි දර්ශන හා මුද්‍රණ උපක්‍රම අඩංගු විය යුතු ය. තමා විශේෂ නිපුණතාවක් දක්වන අංශයක් ඇත්නම් එම අංශයේ පමණක් ඡායාරූප ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන වර්ණ ඡායාරූප 10 ක් ඉදිරිපත් කිරීම.

(ඈ) ඉහත (ආ) සහ (ඇ) දැක්වෙන නිර්මාණ ප්‍රදර්ශන මට්ටමේ ඇති බවට පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්විය යුතු ය.

(ඉ) ඉහත (අ) සුදුසුකම නොමැති දේශීය හෝ විදේශීය ඡායාරූප ශිල්පීන් තමාගේ ඡායාරූප 25ක් සංගමය විසින් පිළිගනු ලබන ප්‍රමිතියකින් යුතු ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 10 ක ප්‍රදර්ශනය කර ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතු ය.

**03. සහාගී සාමාජිකත්වය - Fellowship**

(අ) අයදුම්කරු සංගමයේ සාමාජිකයෙකු විය යුතු අතර, ඇසුරු සාමාජිකත්‍වය ලබා දෙවසරක කාලයක් ගතකොට තිබිය යුතු ය.

(ආ) ඡායාරූප 50 ට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම, මෙයට කලුසුදු ඡායාරූප 25 ක් වත් තිබිය යුතු ය. එහෙත් අපේක්ෂකයාගේ ඉල්ලීම මත ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය පරිදි කිසියම් එක් තේමාවක් හෝ කලුසුදු ඡායාරූප පමණක් ම හෝ වර්ණ ඡායාරූපවලට පමණක් ම හෝ සීමා වූ ප්‍රදර්ශනයක් පැවැත්වීමට ද අවකාශ ඇත. නොඑසේ නම්,

(ආ) ඡායාරූප ශිල්පයේ හෝ කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ වූත්, මූලික සෛද්ධාන්තික කරුණුවලට සීමා නොවන්නා වූත්, පර්යේෂණාත්මක මට්ටමේ ග්‍රන්ථයක් ඉදිරිපත් කළ යුතු ය. මේ සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය හා අවසරය අවශ්‍ය වේ. නොඑසේ නම්,

(ඇ) සංගමය විසින් පිළිගනු ලබන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 25 ක තම නිර්මාණ 50 ක් ප්‍රදර්ශනය වී ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතු ය. (මෙම ව්‍යතිරේකය ප්‍රධාන වශයෙන් ම ශ්‍රී ලාංකික නොවන ඡායාරූප කලාවේදීන් ඉලක්ක කොට ගනු ලබයි. එසේ ම මේ යටතේ සහාගී සාමාජිකත්‍වය අයදුම් කිරීම සඳහා එවැනි ශිල්පීන් සංගමයේ සාමාජිකත්‍වය ලබා තිබීම අත්‍යවශ්‍ය නොවේ.)

## මහා සභාවට පැමිණෙන ඔබට....

වාර්ෂික මහා සභාව දිනයේ සංගමයේ සමරු සටහන් සේ ම තවත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය කිහිපයක් ලබා ගැනීමට ඔබට හැකියාව ඇත. සංගමයේ අනන්‍යතාව සහිත මේවා භාවිත කිරීම ඔබට ආඩම්බරයක් සේ ම සංගමයේ ආර්ථිකයට ද ශක්තියක් වනු ඇත.

පිටු 200 කින් යුතු A5 ප්‍රමාණයේ Photography Note Book
නිල්, කළු, රතු, ජෙල් පෑන්
ලැමිනේට් කළ ෆයිල් කවර,
2016 සාමාජික නාමාවලිය (Directory)
කඳ බඩ වැඩිපුර ඇති අයට වී ෂර්ට් (XXL).

## වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය සැප්. මුල් සතියේ

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය සැප්තැම්බර් මස 02, 03, 04 දිනවල කොළඹ ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරයේ දී පැවැත්වෙන බව ගරු ප්‍රදර්ශන අධ්‍යක්ෂ නාරද අමරතුංග ආරච්චි මහතා පවසයි. ඔබගේ නිර්මාණ ඒ සඳහා ඉදිරිපත් කරන මෙන් ඒ මහතා ඇරයුම් කරයි. ප්‍රදර්ශන අයදුම්පත් හා විස්තර දන් ලබාගත හැකි අතර ප්‍රදර්ශනයේ පූර්ණ අනුග්‍රාහකත්වය Leaf ආයතනය වෙතිනි. විමසීම් - නාරද : 0712791026

## හසිතට - රුවන්ට සවියක් වෙමු

සංගමයේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු මෙන් ම පාඨමාලා උපදේශකවරයෙකු ද වන හසිත ලියනගේ (071 8839314) මහතාගේ නිවස පසුගිය දා හටගත් ගංවතුරට යටවීම නිසා බලවත් අපහසුතාවට ලක්විය. සාලාව යුද හමුදා කඳවුරේ පිපිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ සාමාජික රුවන්සිරි වරකාපොල (077 5054328) මහතා ඒ ඉදිරිපිට පවත්වාගෙන ගිය "ලස්සන ෆොටෝ" චිත්‍රාගාරය මුළුමනින් ම ගිනිබත් විය. අපගේ මේ කල්‍යාණ මිත්‍රයින් වෙනුවෙන් වචනයකින් හෝ ඔබට ශක්තියක් විය හැකි නම් එය උතුම් වූ සද්කාර්යයකි.

## එච්.එම්.ආර්. පෙරේරා අවමංගල ස්තුතිය

පසුගියදා අභාවයට පත්වූ සංගමයේ හිටපු සභාපතිවරයෙකු වූ එච්.එම්.ආර්.පෙරේරා මහතාගේ අවමංගල්‍ය කටයුතු සඳහා විවිධාකාරයෙන් උපකාර කළ හා ඊට සහභාගි වූ සියලු සාමාජික භවතුන්ට සංගමයේ සහ එම පවුලේ සාමාජිකයින්ගේ ගෞරවනීය ස්තුතිය පිරිනැමේ. එසේ ම එම කාර්ය සාධනයෙහි ලා පහත නම් සඳහන් සාමාජික මහත්ම මහත්මීන් ලබාදුන් විශේෂ අනුග්‍රාහක දායකත්වය විශේෂයෙන් අගය කරමු.

මංගල එදිරිසිංහ, ධම්මික විජේසිංහ, එච්.ආර්.එන්. ගුණරත්න, ඒ.එස්.බී. වතුලන්ද, කංචන මාරසිංහ, සමිත රූපසිංහ, ගාමිණී ආර් ෆොන්සේකා, ෆ්‍රැන්ක්ලින් හිංගර්ට්, තුෂාර සමරකෝන්, තිනේෂා එදිරිසිංහ, හේමමාලි අල්විස්, ශාන්ත ගුණරත්න, කීර්ති නිශ්ශංක, උපනන්ද සෙනෙවිරත්න, රවීන්ද්‍ර පුෂ්පකුමාර, උදේනි අල්විස්, රොෂාන් පෙරේරා, රංජිත් පෙරේරා, ෆීලික්ස් ජේ. පෙරේරා, සරත් පෙරේරා, බන්දු ගුණරත්න, නිහාල් අබේරත්න, විජය බස්නායක, අමල් රණවක, සුනිල් වික්‍රම, නාරද අමරතුංග ආරච්චි, ජයනාත් ඉලංගකෝන්, බුද්ධික වික්‍රමසිංහ, එස්.එස්. කුමාර, යමුනි රශ්මිකා, සම්පත් පීරිස්, ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ, සමන් කුලසූරිය, ශාන්තිලාල් ප්‍රනාන්දු, ජේ.පී. ද අල්විස්, එල්.බී.එස්.එස්. බාලසූරිය, ප්‍රගීත්, වජිර වික්‍රමගේ, ප්‍රියන්ත අමරසිංහ, සිතුමිණි රත්නමලල, රත්නා විජේසිංහ, ජයමිණි බුද්ධිකා, අමරා වීරසේකර, උදිත ගයාෂාන්.

## ගංවතුර සහනාධාර ව්‍යාපෘතියට එක්වෙමු

පසුගිය දා අගනුවර ජලගැල්මට හසු වූ පාසල් දරුවන් දස දෙනෙකුගේ අධ්‍යාපන කටයුතු සඳහා අතහිත දීමට සමාජ සේවා හා සුබසාධන අංශය කටයුතු කරමින් සිටී. පොත්පත්, අධ්‍යයන උපකරණ, කවකටු පෙට්ටි, පෑන්, පැන්සල්, ගවුම් රෙදි හා පාසල් බෑග් පිරිනැමීමේ මෙම පුණ්‍ය කාර්යයට ඔබට ද දායක විය හැකි ය. ඒ පිළිබඳ සිංහබාහු (071 8592308) හෝ උදිත (071 8106680) යන අංක අමතා ඔබේ දායකත්වය ලබා දෙන්න. මෙම පරිත්‍යාගය එළඹෙන සැප්තැම්බර් 13 වැනි දිනට යෙදෙන විල්සන් හැගොඩ සමරු දිනය වෙනුවෙනි.

**FIAP ජයග්‍රහණ**

සංගමයේ මඟපෙන්වීම පරිදි ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය විසින් පිරිනමනු ලබන කලාවේදී හා විශිෂ්ටතා සම්මාන දිනාගැනීමට පහත නම සඳහන් ශිල්පීන් සමත්ව සිටින වග සතුටින් දනුම් දෙමු. තවදුරටත් නිර්මාණශීලී ජයග්‍රහණ අත්පත්කර ගනිමින් මවුබිමට කීර්තියක් රැගෙන ඒමට අපි ඔවුනට සුබපැතුම් පිරිනමමු.

1. ටී.ජී. සුනිල් වික්‍රම මහතා - AFIAP
2. විමල් අමරතුංග මහතා - AFIAP
3. වෛද්‍ය ලලිත් ඒකනායක මහතා - EFIAP
4. සංඛ සම්මාන පෙරේරා මහතා - EFIAP
5. ඉඳුනිල් ජීවන්ත මුණසිංහ මහතා - EFIAP
6. විකුම් සේනානායක මහතා - EFIAP

### අපේ ශෝකය



- *අප සාමාජික එච්.ආර්.එච්.එම්.කේ. නාදෙනිය (13/6438) තරුණ මහතා හදිසියේ අභාවප්‍රාප්ත විය. ඒ මහතාගේ වියෝව පිළිබඳ සංගමයේ සාතිශය සංවේගය පළ කරමු.*
- *ජ්‍යෙෂ්ඨ සාමාජික ෂෙල්ටන් කැකුළුවලගේ මහතාගේ කණිටු සොහොයුරු මිල්ටන් කැකුළුවලගේ මහතා හදිසියේ අභාවයට පත්විය. ඒ වෙනුවෙන් අපගේ බලවත් කණගාටුව පවුලේ අය වෙත පිරිනමමු.*
- *ජ්‍යෙෂ්ඨ සාමාජිකා නිල්මිණි කුමාරි ආරියරත්න මහත්මියගේ දයාබර මාමණ්ඩිය පසුගිය දා අභාවයට පත් විය. ඒ පිළිබඳව සාමාජික සැමගේ බලවත් ශෝකය පවුලේ සැම වෙත ප්‍රකාශ කර සිටිමු.*
- *යාවජීව සාමාජික ආචාර්ය රෝහිත වීරසිංහ මහතාගේ දයාබර මාමණ්ඩිය අභාවප්‍රාප්ත විය. අපි එතුමන්ට නිවන් සුව පතමු.*
- *යාවජීව සාමාජික එන්. එච්. ඩී. තමින්ද මහතාගේ දයාබර පියාණන් පසුගිය දා අප අතරින් සමුගත්තේ ය. එම අභාවය පිළිබඳව සාමාජික සැමගේ බලවත් සංවේගය ප්‍රකාශ කර සිටිමු.*


### පිළිසඳරට වෙහෙස මහන්සිය

ප්‍රකාශන අධ්‍යක්ෂ ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා
පිළිසඳර ප්‍රකාශන අනු කමිටුව
1 වසර මින්දුරී අබේසේකර මෙය
චමින්ද වීරසිංහ මහතා
2 වසර මදුෂිකා ලක්මාලි මෙය
ආර්. එම්. මඩවල මහතා
3 වසර චින්තක දන්තනාරායන මහතා